# 10 ශ්‍රේණිය

# ශිල්ප කලා

## පැච්වර්ක් මගින් කුෂන් කවර නිර්මාණය



අන්තර්ගතය - ඒ.ඩී.ඒ.එන්.අරඹේපොල - බප/කැල/ශ්‍රී ධර්මාලෝක ම.ම.වි., කැලණිය

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

10 ශ්‍රේණියේ ශිල්ප කලා විෂය යටතේ ඔබට ඇති හය වන නිපුණතාවය විසිතුරු අලංකරණ නිර්මාණවල යෙදීමයි.

පහත ක්‍රමවේදයන් මඟින් විසිතුරු අලංකරණ නිර්මාණවල යෙදීමට හැකියාව ඇත.

- පැච්වර්ක් මඟින්
- රිබන්වර්ක් මඟින්
- මැහුම් ක්‍රම භාවිතයෙන්
- පබළු භාවිතයෙන්
- ගෙතීම මඟින්







මෙම පාඩම තුළින් පළමු ක්‍රම ශිල්පය වන පැච්වර්ක් ක්‍රම මඟින් විසිතුරු අලංකරණ නිර්මාණ පිළිබඳ පහත කරුණු ඔබට අධ්‍යනයට අවස්ථාව සපයා දීම අපේක්ෂිතය.

***කැබලි රෙදි කිසියම් රටාවකට ගොනු කොට මැසීමෙන් හෝ ඇලවීමෙන් කරන නිර්මාණ පැච්වර්ක් නිර්මාණ ලෙස හැඳින්වේ.***

ඇඳුම් සහ ගෘහ පිලි මැසීමේදී ඉතිරිවන වර්ණවත් රෙදි කැබලි භාවිත කරමින් නිවෙස් අලංකරණය සඳහා පැච්වර්ක් අලංකරණ ක්‍රමය මඟින් විවිධ උපාංග නිර්මාණය කිරීමට හැකියාව ඇත. එම උපාංග අතර,

- කුෂන් කවර
- බිත්ති සැරසිලි
- බඳුන් පලස්
- විසිතුරු අත් බෑග්
- ඇඳ ඇතිරිලි
- කොට්ට උර
- මේස රෙදි
- අත් පසුම්බි ආදිය ඉතිරිවන රෙදි කැබලි ආශ්‍රයෙන් ආකර්ෂණීය ලෙස නිර්මාණය කළ හැකිය.









***පැච්වර්ක් නිර්මාණ කිරීමේදී සැළකිලිමත් විය යුතු කරුණු කීපයකි.***

1) පැච්වර්ක් නිර්මාණය කිරීමට අවශ්‍ය දළ සැලැස්ම සකස්කර ගැනීම
2) නිර්මාණයට ගැළපෙන හැඩතල තෝරා ගැනීම
3) අවශ්‍ය පතරොම් (block) සකස්කර ගැනීම
4) තෝරා ගත් හැඩතල ආකර්ශණීය ලෙස ගැලපීම
5) සේදීම මගින් වර්ණ වෙනස් නොවන රෙදි වර්ග තෝරා ගැනීම
6) ආකර්ෂණීය ආකාරයට වර්ණ ගැලපීම
7) නිවැරදි මැහුම් ක්‍රම යොදා අලංකාර කරගැනීම
8) නිවැරදි නිමාවකින් යුතු අලංකාරවත් නිර්මාණයක් බිහිකර ගැනීම







රෙදි කැබලි එකිනෙක සම්බන්ධ කිරීමට සහ නිර්මාණයන්හි අලංකාරය වැඩිකර ගැනීමට යොදා ගත හැකි මැහුම් ක්‍රම කීපයක් හඳුනා ගනිමු.



දම්වැල් මැස්ම



ලේසි ඩේසි මැස්ම



බ්ලැන්කෙට් මැස්ම



කතිර මැස්ම

*පැච්වර්ක් නිර්මාණ කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය :-*



- කපු නූල්
- අමු රෙදි
- විවිධ වර්ණවල තනි පැහැති රෙදි
- මුද්‍රිත රෙදි
- ඝන කඩදාසි (කාඩ්බෝඩ්)
- ප්‍රස්තාර කඩදාසි
- කාබන් කඩදාසි











***පැච්වර්ක් නිර්මාණ කිරීම සඳහා යොදාගන්නා උපකරණ මෙවලම් :-***

- පැන්සල
- මිනුම් පටිය
- කෝදුව
- ඉදිකටු
- කඩදාසි කපන කතුර
- රෙදි කපන කතුර
- ජ්‍යාමිතික උපකරණ කට්ටලය
- දැති රෝදය
- මහන යන්ත්‍රය











***පැච්වර්ක් ක්‍රමය මඟින් කුෂන් කවරයක් නිර්මාණය කරන ආකාරය බලමු.***

1. පළමුව ඉහත සඳහන් අමු ද්‍රව්‍ය, උපකරණ/මෙවලම් සපයා ගන්න
2. පැච්වර්ක් නිර්මාණය සඳහා දළ සැළැස්මක් සකස් කරගන්න
3. නිර්මාණයට අවශ්‍ය පතරොම් පහත සඳහන් ආකාරයට සකස් කරගන්න

- තෝරාගත් මෝස්තරයේ දිග, පළල තීරණය කරන්න
- ඝන කඩදාසියක් මත එම දිග, පළල අනුව මෝස්තරය ඇඳ ගන්න
- ඇඳ ගත් මෝස්තරයේ කොටස් එකිනෙක කපා වෙන් කරගන්න
- 0.5 cm පමණ මැහුම් වාසි තබා ගැනීම සඳහා කපාගත් පතරොම් කොටස් වෙන් වෙන්ව $A_4$ කඩදාසිය මත අලවා ගන්න
- 0.5 cm පමණ මැහුම් වාසි තබා ගත් පතරොම් කොටස් වෙන වෙනම කපා ගන්න

4. ඔබ සපයා ගත් රෙදි කැබලි වර්ණ ගලපා තෝරා ගන්න
5. තෝරාගත් රෙදි කැබලි මත සකස් කරගත් පතරොම් තබා අවශ්‍ය රෙදි කැබලි ප්‍රමාණ කපා ගන්න
6. සකස් කරගත් දළ සැලැස්මට අනුව කපාගත් රෙදි කැබලි ගලපා ගන්න
7. ඉන් පසුව මැහුම්වාසි දිගේ බොරු නූල් ඇදගෙන පසුව මහන යන්ත්‍රය මඟින් මසා ගන්න
8. අලංකාර මැහුම් ක්‍රමද යොදා හොඳ නිමාවකින් යුත් කුෂන් කවරයක් නිර්මාණය කරන්න









***කුෂන් කවරයට උසස් මට්ටමක නිමාවකින් ලබාදීම සඳහා පහත සඳහන් ක්‍රම අනුගමනය කරන්න.***

- පතරොම නිවැරදිව මිම්වලට අනුව කපා ගැනීම
- සෑම අවස්ථාවකදීම කපු රෙදි යොදා ගැනීම
- වර්ණ සංකලනයන් ක්‍රමවත්ව සිදු කිරීම
- ඉතා ක්‍රමවත්ව සහ අලංකාරවත්ව මැහුම් ක්‍රම යොදා ගැනීම
- නොපිටෙහි ඇති අනවශ්‍ය නූල් කපා ඉවත් කිරීම
- නොපිටෙහි මූට්ටු වැසීම සඳහා රෙදි කැබැල්ලක් තබා පෝරුවක් (lining) යොදා ගන්න







***පැච්වර්ක් නිර්මාණ තුළින් ලබා ගත හැකි වාසි :-***

- විවේක කාලය අර්ථවත්ව යොදා ගැනීම
- ඇඳුම් සහ ගෘහ පිලි මැසීමේ දී ඉවත් කරන කැබලි රෙදි ප්‍රයෝජනයට ගැනීමට හැකි වීම
- විවිධ වූ අලංකාරවත් නිර්මාණ බිහිකිරීමට හැකි වීම
- පැච්වර්ක් නිර්මාණ අලෙවි කිරීම තුළින් ආර්ථික වාසි ලබා ගැනීමට හැකි වීම
- ආත්ම තෘප්තිය ලබා ගැනීමට හැකි වීම



